# රජයේ නිවේදනයයි

## 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත

## 2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි උපලේඛනයේ 1 වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ 11 වන තීරයේ අනුරූප සටහන් වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

මෙම නියමය 2020 සැප්තැම්බර් මස 04 දින සිට ආරම්භ වන මාස 06 ක් දක්වා වූ කාල සීමාවක් සදහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව, වලංගුව පැවතිය යුතුය.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලද 2020.03.07 දිනැති අංක 2165/73 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශිත අදාල නියමය 2020 සැප්තැම්බර් මස 04 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

**මහින්ද රාජපක්ෂ**
**මුදල් අමාත්‍ය**

2020 සැප්තැම්බර් මස ....03....... වන දින
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේදීය.

## උපලේඛනය

| 1 වන තීරය | | | | 11 වන තීරය |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| | සං. ව. ශීර්ෂය | සං. ව. සංකේතය | විස්තරය | |
| 1 | 03.02 | | 03.04 ශීර්ෂයේ කටු ගැලවූ මසුන් සහ අනෙකුත් මසුන්ගේ මස් හැර, අළුත් හෝ ශීතකළ මසුන් | 10% හෝ කි. ග්‍රෑමයට රු 150 යන දෙකෙන් වඩා වැඩි බදු ප්‍රමාණය |
| | 03.03 | | 03.04 ශීර්ෂයේ කටු ගැලවූ මසුන් සහ අනෙකුත් මසුන්ගේ මස් හැර, හිමායිත මසුන් (රේගු සං. ව. සංකේතාංක 0303.54 යටතට වැටෙන මැකරල් මසුන් සහ රේගු සංකේතාංක 0303.55 යටතට වැටෙන ජැක් සහ හෝස් මැකරල් (Jack and horse mackerel - *Trachurus spp./* මසුන් හැර) | 10% හෝ කි. ග්‍රෑමයට රු. 150 යන දෙකෙන් වඩා වැඩි බදු ප්‍රමාණය |
| 2 | 03.03 | 0303.54 | මැකරල්(ස්කොම්බර් ස්කොම්බුස්, ස්කොම්බර් ඔස්ට්‍රාලසිකස්, ස්කොම්බර් ජැපොනිකස්) | කි. ග්‍රෑමයට රු 6.00 |
| | | 0303.55 | ජැක් සහ හෝස් මැකරල් (Jack and horse mackerel - *Trachurus spp./*) | කි. ග්‍රෑමයට රු 6.00 |
| 3 | 07.13 | 0713.31.22 | උඳු : පිට කුරුළුව ඉවත්කළ , පියළි කළ හෝ පියළි නොකළ | කි. ග්‍රෑමයට රු 300.00 |
| | | 0713.31.29 | උඳු :අනෙකුත් | කි. ග්‍රෑමයට රු 200.00 |
| 4 | | 0713.35.90 | අනෙකුත් - කව්පි | කි. ග්‍රෑමයට රු 70.00 |
| 5 | 10.08 | 1008.21.10 | බීජ - කුරක්කන්(ඉලියුසිනේ කොරකානා විශේෂ) | කි. ග්‍රෑමයට රු 70.00 |
| | | 1008.21.90 | බීජ -අනෙකුත් (මිලට්) | කි. ග්‍රෑමයට රු. 70.00 |
| | | 1008.29.10 | අනෙකුත් - කුරක්කන් (ඉලියුසිනේ කොරකානා විශේෂ) | කි. ග්‍රෑමයට රු 70.00 |
| | | 1008.29.90 | අනෙකුත් (මිලට්) | කි. ග්‍රෑමයට රු 70.00 |